# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.02.22 පැය 2330 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out /321/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසයේ ප්‍රසංසනීය කාර්යභාරය වෙනුවෙන් පොලිස් මාධ්‍ය ප්‍රකාශක ASP ෆෙඩ්රික් වුට්ලර් මහතා දෙවනවරටත් ජනතා සම්මානයකින් පිදුම් ලැබූ වගයි.**

වර්තමානයේදී රටට උපයෝගී, විශිෂ්ඨ සේවාවක් සපයන පුද්ගලයින් මෙන්ම 2025 වර්ෂයේ මෙරට වෙනුවෙන් කැපී පෙනෙන සමාජ සේවයක් ඉටුකළ පුද්ගලයන් ඇගයීමට ලක් කළ ජාතිකාභිමානී උත්තමාචාර 2026 (Pride of the Nation Award 2026) සම්මාන උළෙල 2026.02.22 දින සවස කොළඹ 07 පදනම් ආයතනයේදී පැවැත්වුණි.

පසුගිය වර්ෂයේදී පොලිස් මාධ්‍ය කොට්ඨාසයේ අධ්‍යක්ෂක, පොලිස් මාධ්‍ය ප්‍රකාශක ලෙස කටයුතු කරමින් සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම මාධ්‍ය නිවේදන මාධ්‍ය ආයතන වෙත යොමු කිරීමෙන් ප්‍රජාව දැනුවත් විය. තොරතුරු ප්‍රසිද්ධ කිරීමට කැපවීම, Sri Lanka Police නිළ Facebook ගිණුම ඇතුළු ශ්‍රී ලංකා පොලිසියේ සමාජ මාධ්‍ය ජාලා සහ පොලිස් නිළ වෙබ් අඩවිය ඔස්සේ සෘජුවම මහජනතාව වෙත තොරතුරු, අවවාද, උපදෙස් ගෙනයාමට කටයුතු කිරීම වැනි ප්‍රශංසනීය මාධ්‍ය මෙහෙවරක නිරත වීම අගයමින් නීතිවේදී සහකාර පොලිස් අධිකාරී ෆෙඩ්රික් වුට්ලර් මහතා එහිදී ජාතිකාභිමානී උත්තමාචාර සම්මානයෙන් පිදුම් ලැබීය.

සම්මානය කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ මණ්ඩපාධිපති, මහාචාර්ය නීතිඥ ප්‍රතිභා මහානාම හේවා මහතාගේ සුරතින් පිරිනැමුණු අතර පොලිස් මාධ්‍ය කොට්ඨාසයේ ප්‍රගමනය හා ෆෙඩ්රික් වුට්ලර් මහතාගේ ඉදිරි කටයුතු වෙනුවෙන් එහිදී සැමගේ සුභාශිංෂණ එක්කරන ලදී.

සිය ක්‍රියාශීලිභාවය හා අභියෝග ජයගැනීමේ හැකියාව, භාෂා නිපුණත්වය උපයෝගී කරගෙන මෙරට පොලිස් ස්ථාන ගණනාවක ස්ථානාධිපති ධූරය දැරීමට මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාවට සේවය කිරීමට කිහිපවරක්ම අවස්ථාව උදා කරගත් සහකාර පොලිස් අධිකාරී වුට්ලර් මහතා එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ වසර 05 ක් නැගෙනහිර ටිමෝරය, දකුණු සුඩානය වැනි රටවල්වල පොලිස් උපදේශකවරයෙකු ලෙස සේවය කළ, කොළඹ විශ්වවිද්‍යාලයෙන් මානව හිමිකම් පිළිබඳ ශාස්ත්‍රපතියෙකු ද වේ.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය සාම්ප්‍රදායික මාධ්‍යකරණයෙන් ඔබ්බට ගෙන යමින් නව මාධ්‍ය රටාවට අනුගත වෙමින් ජනතාවට තොරතුරු සමීපකරවීම සඳහා පොඩ්කාස්ට් (Podcast) වැනි අන්තර්ජාලය හරහා ඕනෑම වේලාවක සවන් දිය හැකි, එපිසෝඩ (episodes) ලෙස නිකුත් වන ඩිජිටල් ශ්‍රව්‍ය / දෘශ්‍ය වැඩසටහන් මාලාවක් සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ ඔබ වෙත මුදාහැරීමට මූලිකත්වය හා ඊට අදාල සංකල්පය සහකාර පොලිස් අධිකාරී ෆෙඩ්රික් වුට්ලර් මහතාගෙනි.

මෙම ඇගයුම් සම්මානය මහජනතාව වෙනුවෙන් සහ පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙනුවෙන් ඉටුකරන මෙහෙවර වෙනුවෙන් සහකාර පොලිස් අධිකාරී, නීතිවේදී වුඩ්ලර් මහතා ලැබූ දෙවන සම්මානයයි. මෙතුමාගේ නායකත්වය යටතේ පොලිස් මාධ්‍ය කොට්ඨාසය ඉදිරියටත් මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රශංසනීය කාර්යභාරයක නිරත වෙමින් මහජනතාව හා පොලිසිය අතර සබඳතාවය තවදුරටත් ඉහලට ඔසවා තැබීමට හැකිවනු ඇති බව නොඅනුමානයි.

එම අවස්ථාවට අදාල ඡායාරූපයක් මේ සමඟ ඔබ වෙත ඉදිරිපත් කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

## பொலிஸ் ஊடகப் பிரிவின் பாராட்டத்தக்க சேவைக்காக பொலிஸ் ஊடகப் பேச்சாளர் ASP ஃபெட்ரிக் வுட்லர் அவர்கள் இரண்டாவது முறையாக பொதுமக்கள் விருதால் கௌரவிக்கப்பட்டார்

*தற்போது நாட்டிற்கு பயனுள்ள மற்றும் சிறப்பான சேவையை வழங்கி வரும் நபர்களையும், 2025 ஆம் ஆண்டில் நாட்டிற்காக குறிப்பிடத்தக்க சமூக சேவையை ஆற்றியவர்களையும் கௌரவிக்கும் "ஜாதிகாபிமானி உத்தமாசார 2026" (Pride of the Nation Award 2026) விருது வழங்கும் விழா 2026.02.22 அன்று மாலை கொழும்பு 07 அமைந்துள்ள அடித்தள நிறுவனம் (Foundation Institute) மண்டபத்தில் நடைபெற்றது.*

*கடந்த ஆண்டு பொலிஸ் ஊடகப் பிரிவின் பணிப்பாளராகவும் பொலிஸ் ஊடகப் பேச்சாளராகவும் பணியாற்றிய உதவி பொலிஸ் அதிபர், சட்டத்தரணி ஃபெட்ரிக் வுட்லர் அவர்கள், சிங்களம், தமிழ் மற்றும் ஆங்கிலம் ஆகிய மூன்று மொழிகளிலும் ஊடக அறிவிப்புகளை வெளியிட்டு மக்களை விழிப்புணர்வு செய்தார். தகவல்களை வெளிப்படையாக வெளியிடும் அர்ப்பணிப்பு, Sri Lanka Police அதிகாரப்பூர்வ Facebook கணக்கு உள்ளிட்ட சமூக ஊடக தளங்கள் மற்றும் பொலிசின் உத்தியோகபூர்வ இணையதளம் வழியாக பொதுமக்களுக்கு நேரடியாக தகவல்கள், எச்சரிக்கைகள் மற்றும் வழிகாட்டுதல்கள் வழங்கியமை போன்ற பாராட்டத்தக்க ஊடக சேவையை முன்னெடுத்ததற்காக அவர் இவ்விருதால் கௌரவிக்கப்பட்டார்.*

*இவ்விருதை கொழும்பு பல்கலைக்கழகத்தின் ஸ்ரீபாலி மண்டபாதிபதி, பேராசிரியர் சட்டத்தரணி பிரதிபா மஹாநாம ஹேவா அவர்கள் வழங்கினார். அந்நிகழ்வில் பொலிஸ் ஊடகப் பிரிவின் முன்னேற்றத்திற்கும் ASP ஃபெட்ரிக் வுட்லர் அவர்களின் எதிர்கால முயற்சிகளுக்கும் அனைவரும் வாழ்த்துகளைத் தெரிவித்தனர்.*

*தமது செயல்திறன், சவால்களை எதிர்கொள்ளும் திறன் மற்றும் மொழி நுணுக்கத்தை பயன்படுத்தி பல பொலிஸ் நிலையங்களில் நிலைய அதிகாரியாக பணியாற்றியதுடன், சர்வதேச அளவிலும் சேவை செய்ய வாய்ப்பு பெற்றுள்ளார். ஐக்கிய நாடுகள் சபையின் கீழ் கிழக்கு திமோர் மற்றும் தென் சூடான் போன்ற நாடுகளில் 5 ஆண்டுகள் பொலிஸ்*

ஆலோசகராக பணியாற்றியுள்ளார். மேலும், கொழும்பு பல்கலைக்கழகத்தில் மனித உரிமைகள் துறையில் முதுகலை பட்டம் பெற்றவரும் ஆவார்.

பொலிஸ் ஊடகப் பிரிவை பாரம்பரிய ஊடக முறைகளைத் தாண்டி புதிய ஊடக வடிவத்துக்கு ஏற்ப மாற்றி, பொதுமக்களுக்கு தகவல்களை மேலும் நெருக்கமாக கொண்டு செல்லும் நோக்கில் Podcast போன்ற இணையவழி எப்போது வேண்டுமானாலும் கேட்கக்கூடிய, அத்தியாயங்களாக (episodes) வெளியிடப்படும் டிஜிட்டல் ஒலி/ஒளி நிகழ்ச்சித் தொடரை சமூக ஊடகங்கள் வழியாக அறிமுகப்படுத்திய முன்முயற்சி மற்றும் கருத்தாக்கமும் ASP ஃபெட்ரிக் வுட்லர் அவர்களுடையதே ஆகும்.

இந்த விருது, பொதுமக்கள் மற்றும் பொலிஸ் ஊடகப் பிரிவு சார்பாக ஆற்றிய சேவைக்காக ASP, சட்டத்தரணி ஃபெட்ரிக் வுட்லர் அவர்கள் பெற்ற இரண்டாவது பாராட்டு விருதாகும். அவரது தலைமையின் கீழ் பொலிஸ் ஊடகப் பிரிவு தொடர்ந்து ஊடகத் துறையில் சிறப்பான பங்களிப்பை வழங்கி, பொதுமக்கள் மற்றும் பொலிஸ் இடையிலான உறவை மேலும் வலுப்படுத்தும் என்பது உறுதியாகும்.

இந்நிகழ்வை ஒட்டிய புகைப்படம் இதனுடன் இணைக்கப்பட்டுள்ளது.

**பொலிஸ் ஊடகப் பிரிவு**

## Police Media Spokesperson ASP Frederick Wutler Receives People's Award for the Second Time

Assistant Superintendent of Police (ASP) Frederick Wutler, Police Media Spokesperson and Director of the Police Media Division, has been honoured with a People's Award in recognition of his outstanding service marking the second occasion he has received such an accolade.

The Pride of the Nation Award 2026 ceremony, which acknowledges individuals currently rendering exemplary service to the country as well as those who performed distinguished social service during 2025, was held on the evening of 22 February 2026 at the Foundation Institute.

In appreciation of his dedicated efforts in strengthening public communication, ASP Wutler was presented with the National Merit Award. Over the past year, while serving as Police Media Spokesperson, he played a pivotal role in enhancing public awareness by issuing press releases in all three national languages Sinhala, Tamil, and English to media institutions nationwide. He has also actively engaged with the public through the official social media platforms of the Sri Lanka Police, including its official Facebook page and website, providing timely information, guidance, and advice.

The award was presented by Professor Prathibha Mahanama Hewa, Rector of the Sripalee Campus, University of Colombo. The occasion was marked by congratulations and best wishes extended to ASP Wootler and the Police Media Division for their continued progress and future endeavours.

Demonstrating initiative, resilience, and strong linguistic capabilities, ASP Wootler has served as Officer-in-Charge (OIC) of several police stations across the country and has also contributed internationally. He completed five years of service as a United Nations Police

Adviser in countries such as East Timor and South Sudan. In addition, he holds a Master's Degree in Human Rights from the University of Colombo.

Under his leadership, the Police Media Division has expanded beyond traditional media platforms by embracing modern digital communication strategies. Notably, the concept and initiative to introduce a series of online audio-visual programmes such as episodic podcasts accessible at any time via social media networks originated from ASP Wootler, further enhancing public engagement and accessibility to information.

This commendation represents the second award conferred upon ASP Frederick Wootler in recognition of his dedicated service to both the public and the Police Media Division. It is evident that under his stewardship, the Division will continue to make a meaningful contribution to the media sector while strengthening the relationship between the police and the community.

A photograph taken at the occasion is attached herewith.

**Police Media Division**